'පට්ඨාන' ධර්ම දේශනා මාලාවේ (අත්ථි සහ නත්ථි ප්‍රත්‍යය)
25.01.2018 වෙනි දින පැවැත් වූ දේශනාව.

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ සම්මා සම්බුදුරජාණන්වහන්සේට සියලුම ධර්මයන් පරෝපදේශ රහිතව සර්වඥතාඥානයෙන් තමන් වහන්සේම අවබෝධකොට ගත්තා වූ ඉවත් කළයුතු ධර්මයන් ඉවත් කළා වූ වැඩිය යුතු ධර්මයන් වැඩුවාවූ ප්‍රත්‍යක්ෂව අවබෝධ කරගත යුතු ධර්මයන් ප්‍රත්‍යක්ෂව අවබෝධකොට ගත්තා වූ මහා කාරුණික සම්මා සම්බුදුපියාණන් වහන්සේට උන්වහසේගේ අනන්ත බුදුගුණ සිහිපත් කරළා මේ වෙලාවේදී වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

සම්මා සම්බුදුරජාණන්වහන්සේගේ උතුම් වූ ප්‍රඥාවෙන් දැක වාදාළා වූ දැන වදාළා වූ දේශනා කොට වදාළා වූ ඒ උතුම් වූ ශ්‍රී සත්ධර්මස්කන්ධයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් වූ සුපරිසුද්ධ වූ ධර්ම මාර්ගයේ ගමන්කොට ශ්‍රාවක භාවයේ පිහිටා සසර දුකින් මිදී නිවී සැනසුනා වූ අනන්ත ගුණධාරී වූ අෂ්ඨාර්ය පුද්ගල මහා සංඝ රත්නයට මේ අවස්ථාවේදී වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයට ධර්ම රත්නයට සංඝ රත්නයට නමස්කාර කිරීම තුල පහළ වන්නා වූ කුසල චේතනාවන්ගේ ධර්ම චේතනාවන්ගේ පුණ්‍ය චේතනාවන්ගේ ආනුභාව බලයෙනුත් බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නයේ අනන්ත අප්‍රමාණ ගුණානුභාව බලයෙනුත් මේ කථාව අසාගෙන සිටින්නාවූ යහපත් අදහස් ඇති කල්‍යාණ මිත්‍ර පිංවත් සැමදෙනාගේම සන්තාන තුල පහළ වෙන්නාවූ කුසල ධර්මයන්ගේ පුණ්‍ය ධර්මයන්ගේ ආනුභාව බලයෙනුත් අද මේ වෙලාවේ සිහිගන්වාගන්න මතක් කරලා දෙන්නාවූ කරුණු සියල්ලක්ම අපේ පින්වතුන්ට හොඳින් තේරුම් ගැනීමට ශක්තිය අවධි වේවා! සිහිය අවධි වේවා! නුවණ අවධි වේවා! මේ පින්වත් සැම දෙනාටම ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ ගාම්භීර ධර්ම කොට්ඨාසයක ගැනෙන ඉතාමත්ම ගඹුරු ධර්ම කණ්ඩයක් මේ වෙලාවේදී මතක් කරන්න බලාපොරොත්තු වෙන්නේ. ඉතින් ඒ ධර්ම කරුණු ඉතාමත්ම හොඳින් තේරුම් ගන්න ලැබේවා! මේ දහම් පිළිබඳව හිතීම, මේ දහම් පිළිබඳව මෙනෙහි කිරීම මේ දහම් පිළිබඳව මනසිකාරය යෙදීමම සැමදෙනාටම ධර්ම මාර්ගයක් නිර්වාණ මාර්ගයක්ම වේවා කියලා අපි මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

ඒවගේම සම්මත වශයෙන් කථා කරන්නා වූ අවුරුද්දක් ඉදිරිපත් උනා. 2018 අවුරුද්දේ මේ ආරම්භ කරන්නාවූ සාකච්ඡාමය වැඩ සටහන ඉතාමත්ම හොඳින් සාර්ථකව සිද්ධ කරගෙන යන්න හැමදෙනාටම හැකිවේවා! ලෝකයට සම්බන්ධ දේවල් කරන ගමන් තමන්ට අධ්‍යාත්මික ගුණ ශක්තිය දියුණුකරන්න කාලය වෙන් කරගන්නත් හැකි වේවා! ඒවාගේම ඒ කාලයෙන් නියම ප්‍රයෝජනය ගන්නත් ලැබේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම යහපත් නවවසරක් වේවා! ධර්මයෙන් වැඩෙන කාලයක් වේවා!

ඉතින් අපි මේ ප්‍රාර්ථනාවත් එක්ක තමයි අදට නියමිත කරුණු ටික සිහිපත් කරගන්න යොමුවෙන්නේ. පහුගිය දවස්වල අපි කියාගෙන ආවේ බුදුරජාණන්වහන්සේගේ ධර්මයේ නිතර කථා කරන්නේ නැති හැමතැනමත් කථා කරන්නේ නැති නමුත් කථාකළ යුතු සහ දැනගත යුතු ධර්ම ගුණ පිළිබඳවයි. අපි

මේකට මාතෘකා වශයෙන් තබා ගත්තේ පට්ඨාන දේශනාව කියලා. පට්ඨානය කියන එක ඉතාම ගැඹුරුයි. ඉතාමත්ම සූක්ෂමව පිහිටා තිබෙන ක්‍රියාත්මක වෙන විවිධ ආකාරයෙන් මතු වී තිබෙන දහම් ගුණ කොටසක් තමයි ඔය පට්ඨාන ධර්ම යටතේ කථා කරන්නේ. අපි සූවිසි පට්ඨානය කියලා කරුණු 24 ක් කියනවා. අද මාතෘකාවට යන්න කලියෙන් අපි කරපු දේ මොකක්ද කියලා නැවත සිහියට ගන්න එක වටිනවා. අපේ පින්වතුන්ගේ එදිනෙදා වැඩ කටයුතු සහ වෙනත් වෙනත් ධර්ම පැත්තට හැරිලා හිටපු නිසාත් මේ මාතෘකාවේ තිබෙන ගම්භීරත්වයත් මතක නැතිවෙලා කොහෙද අපි කථා කළේ මොනවාද කිව්වේ කියලත් අමතක වෙලා යන්න පුළුවන්.

ඉස්සරවෙලා අපි මෙහෙම හිතා ගනිමු. ප්‍රධාන වශයෙන් ධර්මයේ පැති දෙකක් තිබෙනවා.

- එකක් තමයි හේතු ඵල වශයෙන් පවතින ධර්ම. හේතුවක ඵලයක් හැටියට සංඛතව පහළ වෙන්නා වූ මතුවෙන්නා වූ ක්‍රියාත්මක වෙන්නා වූ ධර්ම ගොනුවක් ධර්ම කාණ්ඩයක් ධර්ම පරාසයක් තිබෙනවා. ඒ තමයි සංසාරයට බර වෙලා තිබෙන ධර්ම. සංසාරයේ ගමන් කරන සත්වයා ඒ හේතු ඵල ධර්ම අස්සේ තමයි ක්‍රියාත්මක වෙන්නේ.

- අනිත් කාණ්ඩය තමයි හේතුවක ඵලයක් නොවන හේතුවකුත් නොවෙන ඵලයකුත් නොවෙන අසංඛත සවභාවය. අසංඛත ධාතුව කියලා කියන්නේ නිවන.

මේ හේතු ඵල ධර්ම අවබෝධ කරගන්නේ නැතුව නිවන අවබෝධ කරගන්න බෑ. බුදුරජාණන්වහන්සේ ගාම්භීර විදියට මේ හේතු ඵල ධර්ම දේශනා කරනවා. ඒ හේතු ඵල ධර්ම දේශනා කරන බුදුරජාණන්වහන්සේ කෙටියෙනුත් දේශනා කරනවා, තරමක විස්තරයක් හැටියටත් දේශනා කරනවා අතිශය ගාම්භීර විස්තරයක් හැටියටත් දේශනා කරනවා. අපි මේක මතක් කළා.

උපදාන ස්කන්ධ පහක් වශයෙන් මේ හේතු ඵල ධර්මය දුක්ඛස්කන්ධයක් යටතේ ක්‍රියාත්මක වෙන ස්වභාවය දේශනා කරනවා. පංච උපාදානස්කන්ධය අරගෙන ඒක දුක්ඛ ස්කන්ධයක්, ඊට පස්සේ ඒ පංච උපාදාන ස්කන්ධය ඇති වෙන්න හේතුව දේශනා කරනවා. ඊළඟට ඒ හේතුව කාම තණ්හා - භව තණ්හා - විභව තණ්හා වශයෙන් තණ්හාව හේතුව කරගෙන චතුරාර්ය සත්‍ය මාතෘකාව යටතේ හේතු ඵල සංග්‍රහයක් බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තිබෙනවා. මේ එක විධියකට හේතු ඵල ධර්මය දේශනා කරන විධියක්. මේකත් අතිශය ගාම්භීර අභිධර්මයක්.

ඊළඟට මධ්‍යම විධියට එක්තරා විස්තරාත්මක ක්‍රමයකට බුදුරජාණන්වහන්සේ හේතුවයි ඵලයයි දේශනා කරනවා. මේ කියන්නේ නිවන නොවෙයි. මේ කියන්නේ සංස්කාර පැත්තට තිබෙන ඒවා. එහෙම දේශනා කරන බුදුරජාණන්වහන්සේ අපි මතක් කරගත්ත වගේ **'අවිජ්ජා පච්චයා සඞ්ඛාරා - සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං - විඤ්ඤාණ පච්චයා නාමරූපං'** ආදී වශයෙන් පටිච්චසමුප්පාද අංග 12 ක් ඉදිරිපත් කරගෙන ඒකෙ ආකාරයෙන් සංසාරයේ හේතුවෙන් ඵලය - හේතුවෙන් ඵලය වශයෙන් එකිනෙකට සම්බන්ධ වෙලා යන විධියක් දේශනා කරනවා. මේ විධියටත් හේතු ඵල දේශනා කළා. ඉස්සෙල්ලා චතුරාර්ය සත්‍ය වශයෙන් දෙවනුව පටිච්චසමුප්පාදය වශයෙන්.

ඊළඟට තව ඊටත් වඩා එහා ගිය විස්තර ගොඩක් තිබෙන ආකාර ගොඩක් තිබෙන නය ක්‍රමත් ගොඩක් තිබෙන ඉතාම සූක්ෂම වෙච්ච ධර්ම කාණ්ඩයක්, ඒ කියන්නේ පට්ඨාන ධර්ම මතෘකාව යටතේ විස්තර කරනවා, **හේතු ප්‍රත්‍යය** ධර්ම කියලා. චතුරාර්යසත්‍ය ධර්ම වශයෙන් කිව්වා - පටිච්චසමුප්පාද ධර්ම වශයෙන් කිව්වා - ප්‍රත්‍යය ධර්ම වශයෙන් කිව්වා. ඒක තමයි අපි මීට කලින් හේතු ප්‍රත්‍යය - අධිපති ප්‍රත්‍යය - අන්නතර ප්‍රත්‍ය වගේ ප්‍රත්‍යය 24 අපි ගොනුකර ගත්තේ.

අපේ පිංවතුන්ට මතක ඇති මේ මාතෘකා 24 යටතේ අපි කථා කරන්න දේශනා කරන්න සාකච්ඡා කරන්න පටන් ගත්තේ ඒ පිළිබඳව මුල් හැඳින්වීමකුත් කරලා. හේතු ප්‍රත්‍යය කියන්නේ මොකක්ද ඊට පස්සේ ආරම්මණ ප්‍රත්‍යය කියන්නේ මොකක්ද කියලා ඔය විදියට ප්‍රත්‍යය ධර්ම ටික කියාගෙන කියාගෙන ඇවිල්ලා 20 වෙනි ප්‍රත්‍යය වගේ වෙනකොට නැවතුනා. ඒ ප්‍රත්‍ය 24 න් තව හතරක් විතර තිබෙනවා අපිට ගොනුකරගෙන කථා කරන්න. ඒකට ආයිමත් මේ පින්වතුන්ගේ සිත යොමුකරගන්න කලින් පට්ඨාන කියන වචනයේ තේරුම නැවත හිතා ගමු. නා නා ප්‍රකාර ප්‍රත්‍යය ධර්ම තිබෙනවා. එතකොට ඔය කුසල අකුසල අව්‍යාකෘත ආදී ධර්මයෝ හේතු ප්‍රත්‍යය වශයෙන් එකට එකට ගලපලා වෙන් කරලා අර්ථ දක්වන ක්‍රමයක් තිබෙනවා. අනිත් එක තමයි විශේෂයෙන්ම බුදුරජාණන්වහන්සේගේ සර්වඥතාඥානය හොඳට පැහැදිලිව දිග හැරලා ගමන් කරවන්න පුළුවන් විසාල මාතෘකා ධර්ම කාණ්ඩයක් තමයි මේ.

නොයෙක් හේතු ධර්මයන් තිබෙනවා, ප්‍රත්‍යය ධර්මයන් තිබෙනවා කියන එක මේකට කිට්ටුවෙන් තියා ගන්න. අපි අහලා තිබෙනවා බුදුරජාණන්වහන්සේ රුවන් ගෙයි වැඩ ඉඳගෙන ධර්මය මෙනෙහි කළා කියලා. ඒ තමයි ගාම්භීර වූ තැනක මේ හේතු ඵල ධර්ම බුදුරජාණන් වහන්සේ මෙනෙහි කළා. ඕක තමයි අපි කියාගෙන එන්නේ. මේ කියාගෙන එන ධර්ම වල අපි පාලි භාෂාවේ වචනයක් පාවිච්චි කරනවා **පච්චය** කියලා. ඒක සිංහල භාෂාවට පරිවර්තනය වෙනවා **ප්‍රත්‍යය** කියලා. මේ පච්චය කියන වචනයේ තේරුම තමයි උපකාරක ධර්මය කියන එක. තවත් ධර්මයකට උපකාර වෙන ධර්මයක් කියන එකයි. ඒකට තමයි ප්‍රත්‍යය ධර්මය කියලා කියන්නේ. මේ ප්‍රත්‍ය ධර්මය තවත් එකකට උපකාර වෙනවා නම් අපි තේරුම් ගන්න ඕනෑ මේ වෙලාවේදී ඇයි යම් ධර්මයක් අනිත් ධර්මයකට උපකාර වෙන්නේ, ප්‍රත්‍යය වෙන්නේ, හැම එකකටම ඒක පුලුවන්ද කියලා.

එහෙම හිතුවහම දැන් මනුස්සයෙක් ඉන්නවා, ඒ මනුස්සයා තව මනුස්සයෙකුට උදව්වක් කරනවා. අපි හිතමු මනුස්සයෝ දෙන්නෙක් ඉන්නවා. එක්කෙනෙක් උදව්ව ලබනවා, වෙනත් කෙනෙකුගෙන්. ඒ මනුස්සයා අනිත් මනුස්සයාට උදව් කරන්නේ යම්කිසි ගුණයක් නිසයි. ඒක කරුණා ගුණය මෛත්‍රී ගුණය වගේ ඒවා නොවෙයි. එහෙම එකකුත් තිබෙන බව හැබෑව. මනුස්සයෙක් තවත් මනුස්සයෙකුට උදව් කරන්නේ තවත් කෙනෙකුට උදව් කිරීමට තරම් හැකියාවක්, ශක්තියක්, බලයක්, ගුණයක් ඒ මනුස්සයා ළඟ තිබෙන නිසා. එතකොට හොඳට තේරුම් ගන්න මෙතැන ධර්මතා දෙකක් තිබෙනවා. එකක් තමයි ඒ මනුස්සයා (උදව්ව ලබන කෙනා නොවෙයි). ඒ මනුස්සයා ළඟ තිබෙන උදව් කිරීමේ හැකියාව කියන එක තව එකක්. ඕක ධර්මතා දෙකක්. සමහර වෙලාවට ඉන්නවා මිනිස්සු ඒ අය අනිත් කට්ටියට උදව් කරන්න යන්නේ නෑ. හිතලා බලන්න ඇයි උදව් කරන්න යන්නේ නැත්තේ කියලා. මනුස්සයා හිටියට ඒ මිනිස්සුන්ට තවත් කෙනෙකුට උදව් කිරීමේ හැකියාව කියන එක නෑ. ඒක නිසයි යන්නේ නැත්තේ. මෙතැන මේ කියන කථාවේ මනුස්සයා ඉන්නවා, මනුස්සයා තවත් එක්කෙනුකට උදව්වක් කරනවා. එයා උදව් කරන්නේ උදව් කිරීමේ හැකියාව ශක්තිය එයා ගාව තිබෙන නිසා. ඒ උදව් කිරීමේ ශක්තිය කියලා කියන්නේ අමුතු ධර්මයක්.

එතකොට ඒ මනුස්සයාට කියනවා නමක්. ඒ මනුස්සයා තමයි **ප්‍රත්‍යය ධර්මය**. ඒ කියන්නේ උපකාර වෙන්න පුළුවන් උපකාරක මනුස්සයා. එතකොට උපකාරක මනුස්සයා ගාව තිබෙන උපකාරක හැකියාව උපකාරක ගුණය උපකාරක ශක්තියට කියනවා **ප්‍රත්‍යය ශක්තිය** කියලා. දැන් බලන්න ප්‍රත්‍යය ධර්මය සහ ප්‍රත්‍යය ශක්තිය. ප්‍රත්‍යය ධර්මයක් තිබෙනවා, ඒ උපකාරක ධර්මය ඇතුලේ තමයි උපකාරක ශක්තිය තිබෙන්නේ.

තවත් එකක් අපි හිතමු මෙහෙම, දැන් සමහර බෙහෙත් තිබෙනවා. ඒ බෙහෙත් වල තිබෙනවා රෝගයක් නිවාරණය කරන ගතිය. බෙහෙතක් කියලා කිව්වහම ඒක ද්‍රව්‍යාත්මක දෙයක්. ඒක

බොන එකක් හරි කන එකක් හරි මොකක් හරි ද්‍රව්‍යක්. ඒක ඇතුලේ තිබෙනවා අමුතුම ගුණ විශේෂයක්, ලෙඩේ නැති කරන, ලෙඩකට පිහිට වෙන, ලෙඩක් සමනය කරන. දැන් බෙහෙත් පෙති දහයක් ගත්තොත් ඒක ගණන් කරන්න පුළුවන්. ඒක ප්‍රමාණ කරලා තමයි ගණන් කරන්නේ, හැබැයි ඒ තමයි ප්‍රත්‍යය ධර්මය. ඒ පෙත්තක් හැටියට තිබෙන බෙහෙත ඇතුලේ තිබෙනවා ලෙඩ නිවාරණය කරන සමනය කරන ශක්තියක්. පෙත්ත පේනවා නමුත් ශක්තිය පේන්නේ නෑ. ඒක බෙහෙත් පෙත්ත ඇතුලේ කැවිලා කෙටිලා තිබෙන එකක්. එතකොට මේ බෙහෙත් පෙත්තේ ඇතුලේ තිබෙනවා බෙහෙත් ගතිය කියලා එකක්. ඒකට කියනවා බෙහෙත් ශක්තිය, ප්‍රත්‍යය ශක්තිය කියලා. බෙහෙත් පෙත්තයි බෙහෙත් පෙත්තේ රෝග නිවාරණය කරන ශක්තියයි කියලා කියන්නේ එක තැන තිබෙන දෙයක්. කථා කරනකොට අපි කියනවා බෙහෙත් බිව්වා කියලා, අපි ඒ ශක්තිය ගැන කථා කරන්නේ නෑ ලෝක ව්‍යවහාරයෙන් නමුත් මේක ගැන ගැඹුරින් හිතනකොට ගැඹුරින් කල්පනා කරනකොට තමයි ඒක මතුවෙන්නේ.

බුදුරජාණන්වහන්සේ විසින් දේශනා කරපු අපේ සැරියුත් ස්වාමීන්වහන්සේ විසින් ගෞරවයෙන් විස්තර කරලා තිබෙන ධර්ම කාණ්ඩය බලාගෙන බලාගෙන යනකොට ඒවගේ තැනක් තමයි අපි දැන් මේ දක්වාම කථා කරගෙන කථා කරගෙන ආවේ. ඒ තමයි ප්‍රත්‍යය ධර්මය සහ ප්‍රත්‍යය ශක්තිය යන දෙක. ඒවගේ ප්‍රත්‍යය උපකාරක ධර්ම 24ක් තිබෙනවා කියලා කිව්වා. ඒ උපකාරක ධර්ම 24 න් අපි අවසානයට විප්පයුත්ත ප්‍රත්‍යය තමයි කිව්වේ. එතැනින් අපි ඉස්සරහට ගියේ නෑ. යම් යම් කටයුතු කාරණා බහුලවීම නිසා අපේ සාකච්ඡාව මග නතර උනා, දැන් අපි මේක අවධි කරලා ගන්න ඕනෑ.

මේ කථාව හරි ගාම්භීරයි. මේක සර්වඥතාඥානයට විෂය වෙන්නා වූ කොටසක්. අපි මේ දේශනා කරන්නා වූ ස්වාමීන්වහන්සේලා උනත් ඒක දේශනා කරලා තිබෙන න්‍යාය ධර්මයක පිහිටලා තමයි දේශනා කරන්නේ. ඒක ප්‍රත්‍යවේක්ෂා කරන්න හිතන්න මෙනෙහි කරන්න උපකාරකයි. ඒ න්‍යාය තවම මේ ලෝකයේ ඉතුරුවෙලා තිබෙනවා. භාෂාව වශයෙන් ධර්ම විස්තර වශයෙන් ඉතුරු වෙලා තිබෙනවා, ඒක නිසා තමයි තවම කියන්න පුළුවන් කම තිබෙන්නේ. බුදුරජාණන්වහන්සේට ඒ න්‍යායත් පුළුවන් බුදුරජාණන්වහන්සේට ඒ සියල්ල හොඳට පේනවා. මේ ධර්මය කියලා දෙන්නාවූ දේශකයන් වහන්සේලා ඒක අනුගමනය කරලා ඒකෙන් තමයි ධර්ම අහුලන්නේ. මේ පින්වතුනුත් ඒකට දක්ෂ වෙන්න ඕනෑ. හිතන්න ඕනෑ, මෙනෙහි කරන්න ඕනෑ. හැම වෙලාවේම හිතන්න ඕනෑ 'උපකාරක ධර්මයක් තිබෙනවා, උපකාරක ධර්මය ඇතුලේ උපකාරක ශක්තියක් තිබෙනවා' කියලා. මේක හොඳට හිතේ තියාගන්න. ප්‍රත්‍යයක් තිබෙනවා ප්‍රත්‍යය ශක්තියක් තිබෙනවා. මේ කථා කරන්නේ ප්‍රත්‍යය ශක්තිය වලින් යුක්ත වෙච්ච ධර්ම ගොඩවල්.

මේක කථා කරනකොට අපි මතක තබා ගන්න ඕනෑ ලෝක ව්‍යවහාරයේ තිබෙන්නා වූ දේවල් කියලා දෙන්න උපමා හැටියට ගත්තට අපි මේ කථා කරන්නේ ලෝක ව්‍යවහාරයේ තිබෙන ඒවා නොවෙයි. 'චිත්ත' 'චෛතසික' 'රූප' 'නිර්වාණ' කියන්නා වූ සියුම් වූ පරමාර්ථ ධර්මයකට බැහැලා චිත්ත පරමාර්ථයට ධර්මයට බැහැලා චෛතසික පරමාර්ථය ධර්මයට බැහැලා රූප පරමාර්ථයට ධර්මයට බැහැලා නිර්වාණ කියන පරමාර්ථයට ධර්මයට බැහැලා ඒ ගැඹුරක තමයි මේක කථා කරන්නේ. යම්කිසි කෙනෙකුට හැම වේලාවේම ඒ ධර්මයකට හිත යොමුකරලා හිත රඳවා ගන්න හිත රඳවලා තියා ගන්න පුලුවන්නම් මේ ධර්මය තේරුම් ගන්න පුළුවන්. ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ මට්ටමට නැති උනාට නිවන් අවබෝධ කරගන්න පුළුවන් ප්‍රමාණයට යම් ධර්මයක් ගොඩ නගා ගන්න පුළුවන්.

අනිත් එක තමයි මේ ධර්මය සෝවාන් සකෘදාගාමී අනාගාමී අරිහත් යන මාර්ග ඵල, චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කර ගැනීමට ඒකාන්තයෙන්ම හේතු වෙන ධර්මයක්. ඒ වගේම ඉතාමත්ම ගාම්භීර වූ ධර්මයක්, සසර දුකින් මිදිලා නිවනට යන්න උපකාරවෙන ශ්‍රේෂ්ඨ වූ උතුම් වූ ධර්මයක්. ඒක

නිසා මේ ගැඹුරින් තිබෙන ධර්මය හොඳට අහන්න. හොඳට සිහිය මෙහෙයවන්න පුළුවන් අයට තමයි මේක ගැලපිලා යන්නේ. අනිත් අයට ටිකක් අමාරු වෙයි කියන එකත් කියන්න ඕනෑ.

නිවන කියන්නේ රූපයක් නොවෙයි. රූපය කියන්නේ නිවන නොවෙයි. හිත කියන්නේ රූපය නොවෙයි, රූපය කියන්නනේ හිත නොවෙයි. හිත කියන්නේ චෛතසික නොවෙයි, චෛතසික කියන්නේ හිත නොවෙයි. රූපය කියන්නේ චෛතසික නොවෙයි, චෛතසික කියන්නේ රූප නොවෙයි. මේ ධර්ම එකින් එකටම වෙනස්. නිවන වෙනම ආකාරයක තිබෙන එකක්. රූපය වෙනස් විදියක තිබෙන එකක්. හිත වෙනස් විදියකට පවතින එකක්. චෛතසික වෙනස් විදියට පවතින ධර්මයක්. චෛතසික අතරත් ගත්තට පස්සේ ලෝභය සම්පූර්ණ වෙනස් ද්වේශයට, ද්වේශය සම්පූර්ණ වෙනස් මෝහයට. මෝහය වෙනස් දෘෂ්ඨියට. මේ විදියට හේතු ඵල ධර්ම හැටියට මතුවෙන ධර්ම ගොඩේ එකින් එකට වෙනස් වූ ලක්ෂණයන්ගෙන් හැකියාවන්ගෙන් ශක්තියෙන් යුක්ත වෙච්ච වෙන වෙන ධර්ම ටිකක් තිබෙන්නේ. ඒ කියන්නේ වෙන වෙනම ශක්ති ටිකක් තිබෙන්නේ. ඒ වෙන වෙනම ශක්ති තිබෙන්නේ වෙන වෙනම ධර්ම වල. හිතේ තිබෙන ශක්තිය නෑ චෛතසික වල චෛතසික වල තිබෙන ශක්තිය නෑ හිතේ. රූපවල තිබෙන ශක්තිය හිතට නෑ, හිතේ තිබෙන ශක්තිය රූප වල නෑ. එක එක වෙනස් වෙනස් ශක්ති තිබෙන ධර්ම. ඒ වගේ වෙන වෙන ශක්ති ටිකක් තමයි තිබෙන්නේ. ඒ ටික ඇරුනහම එතන සත්වයෙක් නෑ කියන තැනට එනවා.

දැන් මේ පට්ඨාන පාඩම තුලින් කරගෙන යන්නේ ඒ වෙන වෙන ධර්ම මොනවාද, වෙන වෙන ධර්ම වල තිබෙන්නා වූ වෙන වෙන ශක්ති මොනවාද කියලා තේරුම් කරලා දෙන එක සහ ඒ ශක්තිය තවත් ශක්තියකට හේත්තුවක් නැත්නම් බලපෑමක් උපකාරයක් දක්වන්නේ කෙසේද කියන එක තමයි මේ කියන්නේ. එක ශක්තියක් තවත් ශක්තියකට බලපෑමක් කරනවා උපකාරයක් කරනවා. නමුත් හැම එකකටම ඒක බෑ. එක ධර්මයක් තවත් එකකට උපකාර කරනවා නමුත් හැම එකකටම උපකාර කරන්න බෑ. ඒක එක පැත්තකට විතරයි, තව එකකට නොවෙන්න පුලුවන්. අන්න ඒ ශක්ති වෙන වෙනම - වෙන වෙනම කියලා දෙන හොයලා බලන මෙනෙහි කරන පාඩමක් තමයි මේ.

මේ ධර්ම නිතර නිතර කථා කළේ නැත්නම් මේක අභාවයට යනවා. ඒකට කාරණයක් තිබෙනවා. පුථුජ්ජන හිත ලෝකයත් එක්ක ගැවසීගත්ත හිත ලෝක සංකල්ප එක්ක ගැට ගැහි හිත හිතා ඒවත් එක්ක පැවතිච්ච හිත හරි ඉක්මනට ඒ පැත්තට ගොඩ වෙනවා. ඒ පැත්තට බර වෙනවා. ලෝක චින්තනයෙන් ලෝක සංකල්පනාවෙන් ලෝකයේ විදියට හිතන එකින් අයින් වෙලා ගැඹුරු විදියට හිතන එක හිතට අලුත්. ඒක කොච්චර ප්‍රණීත විදියට හිතට දැනුනත් ඒ පුරුද්ද බලපානවා. ඒක නිසා ඒ ගැඹුරු ධර්මය නිතර කථා කළේ නැත්නම් හිතුවේ නැත්නම් මෙනෙහි කළේ නැත්නම් ලෝකයේ තිබෙන්නා වූ මට්ටමට ආයිමත් හිත ගැලවිලා යනවා. ඒක නිසා මේ ගැන නිතර කථා කළ යුතුයි. ඒක හරි වටිනවා. අනිත් එක තමයි ධර්ම අවධියක් අපේ හිත්වල ඇති වෙනවා. ධර්මය පැත්තට හිත අවධි කරලා තබනවා, නිතර නිතර කථා කිරීම නිසා.

බුදුරජාණන්වහන්සේ ඒක නිසාම කථා කරන්න මාතෘකා දහයක් අනුමත කළා. ඒ මාතෘකා වල තිබෙනවා අප්පිච්ඡකථා - සන්තුට්ඨකථා - විවේකකථා - අසංසග්ගකථා - විරියාරම්භකථා - සීලකථා - සමාධිකථා - පඤ්ඤාකථා - විමුත්තිකථා - විමුත්තිඤාණදස්සනකථා කියලා කථා දහයක්. ඒ කථා දහයය මේකේ අන්තර්ගතයි. එහෙම කථා කරන මොහොතේ අපි ලෝක මට්ටමෙන් හරි කෙලෙස් අයින් කරලා තාවකාලිකව හෝ විෂ්කම්භන ප්‍රහාණයෙන් හෝ සිත නිවාගෙන සනසාගෙන එතැනට අරගෙන යනවා. ඒක නිසා මේක හරි වටිනවා.

තවත් එකක් තමයි දැන් කාගේ හරි අම්මා තාත්තා නැති උනොත් එහෙම ඒ මරණයට ඇත්ත වශයෙන්ම යනවා. මෙන්න මෙහෙම සිද්ධියක් උනා. එක පවුලක පිය කෙනෙක් අන්තරා උනා වෙන

රටක. අන්තරා වෙලා ඒ මරණය ශ්‍රී ලංකාවට අරගෙන ගිහිල්ලා එහෙ තමයි කටයුතු කළේ. මේක දිහා හොඳට බැලුවයින් පස්සේ සමහර අයගේ අම්මා අන්තරා වෙනවා, ලංකාවට අරගෙන යනවා. ලංකාවේ අවසාන කටයුතු කරනවා. ඒ දේහය දවනවා එහෙම නැත්නම් භූමදානය කරනවා. එතකොට මේ මවුගුණ පියගුණ කියලා ජාතියක් තිබෙනවා. ඒ ගැන කථා කරනවා. ඇත්තට මේ අම්මා කියලා කියන්නේ මොකක්ද? ඇයි මෙච්චර මේ බුදුරජාණන්වහන්සේ මේ විදියට අනුමත කළේ? වඳින්න පුදන්න සලකන්න බණින්න එපා ගහන්න එපා දොස් කියන්න එපා කියලා ඇයි එහෙම දේශනා කළේ? ඇත්තට ඒ මොකක්ද කියලා බැලුවහම මොකකටද මේ සලකන්නේ? අපි වගේම අතක් පයක් ඔලුවක් තිබෙන ශරීරයක්. ඇත්තට බැලුවහම පංච ස්කන්ධයක්. රූපය වශයෙන් බැලුවහම සමානයි. කන්නෙත් එළවලු බත් මාළු, එතකොට ඇයි එතැනට විශේෂයක් දක්වන්නේ? මොන අංගයටද කියලා හිතනකොට අපිට ප්‍රශ්නයක් හිටිනවා.

ඇත්තටම මාතෘත්වය කියලා කියන්නේ සිතක් චෛතසික ධර්ම ගොනුවක් අමුතු විදියකට ගුණයක් උලුප්පවාගෙන ක්‍රියාත්මක වෙනවා, අපේ මේ ජීවිතියට. අපේ ඇසට, කනට, නාසයට, මේ ආයතන වලට, මේ පංච ස්කන්ධයට වෙනත් පංච ස්කන්ධයක් වෙනත් ආයතන ටිකක් අමුතු විදියට ක්‍රියාත්මක වෙනවා. ඒ ක්‍රියාත්මක වීමේදී මවු ගුණය කියලා ගත්තම එතැන තිබෙනවා කරුණාව කියන චෛතසිකය. කරුණාව කියන චෛතසිකය පුදුම විදියට වෙනත් තැනක ක්‍රියාත්මක නොවෙන විදියට අපිට අම්මා වූ පංච ස්කන්ධයේ ක්‍රියාත්මක වෙනවා. ඒක නිසා අපි අම්මට වඳිනවා කියන්නේ තාත්තට වඳිනවා කියලා වඳින්නේ ඔය කියන්නා වූ කරුණාවට, ඔය කියන්නා වූ මෘදු ගුණයට, ඒ කරුණා චෛතසිකයට. ඔය කරුණා ගුණය - මෛත්‍රී ගුණය - උපේක්ෂා ගුණය ඒ වගේම නිර්ලෝභී ගුණය තමයි ඒ රූපය වටකරලා අපි මාතෘත්වය හැටියට සලකා ගන්නේ. ඒ අම්මාගේ අත්දෙක පාදෙක ඇස් දෙක කන්දෙක හිස මේ ශරීරය කියන ඔක්කොම දරුවෙක් හැටියට සලකන්නා වූ පංච ස්කන්ධය වෙනුවෙන් අර කරුණාව කියන්නා වූ ඒ ගුණය අමුතුම විදියට බැහැගෙන යනවා. ඇත්ත වශයෙන්ම අම්මා කියලා ගන්නකොට කොතනටද අපි වඳින්නේ කියලා ගත්තහම ඇත්තටම වඳින්නේ අර ගුණයන්ට. ඒක නිසා ඒ කරුණා ගුණය මෛත්‍රී ගුණය කියන ඒවාට තමයි අපි වඳින්නේ.

මේ පට්ඨාන ධර්ම කියාගෙන යනකොට ඇත්ත වශයෙන්ම අම්මලා තාත්තලා නෑ. අම්මා කෙනෙක් ගැන කථා කරන්නෙත් නෑ තාත්තා කෙනෙක් ගැන කථා කරන්නෙත් නෑ. ගුණ ස්වභාව ටිකක් පමණක් කථා කරනවා. එතකොට මේ පට්ඨානය අම්මා තාත්තාට යොදන්න බැරිද කියලා ප්‍රශ්නයක් එනවා. පුළුවන්, නමුත් එතැනට යන්නේ වෙන විදියකට. ඒක නිසා පොඩියට පොඩියට කඩලා ගත්තට පස්සේ අවසානයේදී ඇත්ත වශයෙන්ම මාතෘත්වය පීතෘත්වය කියලා කියන්නේ 'කරුණා ගුණය' 'මෛත්‍රී ගුණය' 'ඊර්ෂ්‍යාව නැති මුදිතා ගුණය' ඒවගේම කොයි පැත්තකටවත් පෙරලෙන්නේ නැති 'අකම්පිත වූ උපේක්ෂා ගුණය' 'අලෝභ චෛතසිකය' වගේ කුසල චෛතසික ටිකක් තමයි අපිට මාතෘත්වය හැටියට ඉදිරිපත් වෙන්නේ. ඇත්තටම ලෝකය ගැන කථා කරනකොට ඔය වගෙයි.

මේ පට්ඨානයේ කථා කරන චිත්ත චෛතසික ධර්ම රූප ධර්ම මණ්ඩලයක් වගේ එක පොදියට ඒ ධර්ම ටික එකිනෙකාට උදව් උපකාර කරමින් පවතිනවා. ඒක ගලවලා ලිහලා ඒ ධර්ම වල තිබෙන පෞද්ගලික ගුණ ලක්ෂණ (individual qualities) හොඳට දැනගන්න හිත යොදන එක තමයි අපේ මේ පට්ඨාන සාකච්ඡාව තුලින් සිද්ධ වෙන්නේ. ඒ විදියට තමයි බුදුරජාණන්වහන්සේගේ දේශනා සැරියුත් ස්වාමීන්වහන්සේ විස්තර කරලා තිබෙන්නේ.

තව එකක් මතක තබා ගන්න ඕනෑ. එක ධර්මයක තිබෙනවා හැකියාවල් ගොඩක්. සමහර ධර්ම වල හැකියාවල් දෙකක් තිබෙනවා සමහර ධර්ම වල හැකියාවල් තුනක් තිබෙනවා. සමහර ධර්මවල හැකියාවල් හතර පහක් තිබෙනවා. ඒ වගේ ගුණ හැකියාවල් ගොඩක් තිබෙනවා. ඒවත් අපි හොඳට තේරුම් ගන්න මහන්සි ගන්න ඕනෑ. ඒකට උදාහරණයක් මෙහෙම කියන්න පුළුවන්. ප්‍රඥාවේ

හැකියාවල් ගණනක් බුදුරජාණන්වහන්සේ මෙහෙම දේශනා කරලා තිබෙනවා. ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ තිබෙනවා ඤාණං උදපාදි - පඤ්ඤා උදපාදි - විජ්ජා උදපාදි - ආලොකො උදපාදි කියලා. බලන්න එකම ප්‍රඥාවේ හැඩතල කීයක් දේශනා කරලා තිබෙනවාද කියලා. ඔය ඔක්කොම ටික තිබෙන්නේ එකම ධර්මයේ. අපි ප්‍රාර්ථනා කරනවා බොහෝම මෛත්‍රීයෙන් හැම එක්කෙනාටම එක ධර්මයක තිබෙන කෘත්‍ය හැකියාවන් සහ ලක්ෂණ ටික, ප්‍රධාන හැකියාව සහ තවත් ඒකට ඇදීලා තිබෙන්නාවූ ගුණ ටිකයි දැක ගන්න දැන ගන්න හොඳට ශක්තිය හදාගන්න හැකිවේවා කියලා මේ සාකච්ඡාව තුලින්.

තවත් පොඩි උදව්වක් කරන්නම්. මාර්ග සිත ගැන බලන්න. මාර්ග සිතට කරුණු දෙකක් කියනවා. එකක් කියනවා පළවෙනි මාර්ග සිතෙන් කෙලෙස් තුනක් කපනවා කියලා. පළවෙනි මාර්ග සිතෙන් සක්කාය දිට්ඨිය - විචිකිච්ඡා - සීලබ්බත පරාමාස කියන ධර්මතා තුන නැති කරලා විනාස කරලා කපලා සම්පූර්ණයෙන්ම විනාස කරනවා කියලා කියනවා. ඒ හැකියාව ඒකෙ තිබෙනවා. දැන් නැවතත් අනිත් පැත්තට හිතලා බලන්න, සෝවාන් මාර්ග සිතට අරමුණු වෙන්නේ මොකක්ද කියලා. ඒ මාර්ග සිතට එක කලේශයක් වත් අරමුණු වෙනවද? සක්කාය දිට්ඨිය අරමුණු වෙනවද? සීලබ්බත පරාමාසය අරමුණු වෙනවද? විචිකිච්ඡාව අරමුණු වෙනවද? නෑ, මේ තුනෙන් එකක්වත් අරමුණු වෙන්නේ නෑ මාර්ග සිතට. මාර්ග සිතට අරමුණු වෙන්නේ අසංඛත ධාතුව නම් වූ නිර්වාණ ධාතුවයි. දැන් බලන්න කෙලෙස් කැපීමේ හැකියාවත් තිබෙනවා නිවන් දැකීමේ හැකියාවත් තිබෙනවා එකම තැන. ඒක නිසා එක ධර්මයක තිබෙනවා පුදුම විදියේ ආනුභාව සම්පන්න හැකියාවල්. ඒවත් අපි තේරුම් ගන්න ඕනෑ, මේ කථාවේදී. එතකොට අපිට ධර්මය තෙරුම් ගන්න ලේසියි. සමහර වෙලාවට බුදුරජාණන්වහන්සේ ධර්ම හතර පහක් තිබෙන තැනක එක ගුණයක් එක්කෙනකුට දේශනා කරනවා. ඒකම තව තැනක ගිහිල්ලා ඒකෙම ඊළඟ ගුණය තව එක්කෙනකුට දේශනා කරනවා, එකම ධර්මය. මේකත් මම මේ මතක් කළේ මේ පින්වතුන්ගේ මේ පට්ඨාන සාකච්ඡාවට පට්ඨාන ධර්ම අහුලන මේ වැඩේට හිතන්න උපකාර වෙන ධර්ම කොටසක් හැටියට.

හොඳයි, මේක මම නැවත ආරම්භයක් හැටියටයි මේක පටන් ගත්තේ. අපිට තව ප්‍රත්‍යය ධර්ම 4 ක් ගැන සාකච්ඡා කරන්න තිබෙනවා. ඒ සාකච්ඡා කරන්න යන ප්‍රත්‍යය ධර්ම හතරෙන් ආරම්භක පොඩි කොටසක් කියලා අපි අදට අවසන් කරමු. අපිට කථා කරන්න තිබෙනවා අත්ථි ප්‍රත්‍යය - නත්ථි ප්‍රත්‍යය විගත ප්‍රත්‍යය - අවිගත ප්‍රත්‍යය කියලා ප්‍රත්‍යය ධර්ම 4 ක්. ඒ ප්‍රත්‍යය ධර්ම අතරෙන් 21 වෙනි ප්‍රත්‍යය තමයි අත්ථි ප්‍රත්‍යය. පාලි භාෂාවෙන් **'අත්ථි'** කියලා කියන්නේ **'තියෙනවා'** කියන එකයි. නැත්නම් **'පවතිනවා' විද්‍යාමාන වෙනවා,** ඒ කියන්නේ දැනට 'live' කියන එක. මේ **'තියෙනවා'** කියන එක මේ විදියට හිතා ගන්න. සෑම ධර්මයක්ම උපදිනවා - තිබෙනවා - නැතිවෙනවා = උප්පාදයයි - ඨිථියයි භංගයයි - කියලා තිබෙනවා. ඊට පස්සේ උප්පාදයයි - ඨිථියයි - භංගයයි කියන එක එතැනින් අයින් වෙච්ච ගමන් ඒක නෑ. උප්පාද - ඨිථි - භංග කියන තැන බොහෝම සියුම් තැනක්. ඒ හරිය කොතැනක හරි තිබෙනවාද අන්න එතැන තමයි **'තිබෙනවා'** කියලා කියන්නේ. එතකොට මේ උප්පාද - ඨිථි - භංග යන අවස්ථාවට යමක් පත් උනහම **'තියෙනවා'** කියලා ගන්නවා. දැන් අපිට ඔය වට පිටාවේ ජේන්න තිබෙන දේවල් ජේන්නේ උප්පාද - ඨිථි - භංග අවස්ථාවේ තිබෙන දේවල් පමණයි. ඉස්සෙල්ලා තිබ්ච්ච ටික දැන් ජේන්නේ නෑ. ඒවා භංගයෙන් බිඳිලා ගිහිල්ලා. එතකොට දැන් අපි හතර වටේම බැලුවොත් එහෙම - ඨිථි - භංග කියන අවස්ථා තුනේ වැඩ කරන්නා වූ ක්‍රියාත්මක වෙන්නා වූ දේවල් තමයි අපිට තිබෙන්නේ. ඒක නිසා මෙතැන තිබෙනවා කියලා කියන්නේ මේ අවස්ථා තුනට පැමිණෙන ධර්ම.

මේ උප්පාද - ඨිථි - භංග කියන අවස්ථා තුනට එන්නේම හේතු ඵල ධර්ම යටතේ එන ධර්ම. හිත කියන එක උප්පාද - ඨිථි - භංග වලට එනවා. එතකොට චෛතසික ධර්ම උප්පාද - ඨිථි - භංග වලට එනවා. රූපත් උප්පාද - ඨිථි - භංග වලට එනවා. මේ ධර්මතා විතරයි උප්පාද - ඨිථි - භංග යටතේ කථා කරන්න

පුළුවන්. නිවන උප්පාද - තිථි - භංග යටතට එන්නේ නෑ. එතකොට නැති එකකට තවත් එකකට උදව් කරන්න බෑනේ. දැන් මැරිච්ච මනුස්සයෙකුට බෑ ජීවත් වෙලා ඉන්න මනුස්සයෙකුට උදව් කරන්න. එයා ජීවතුන් අතර ඉන්නකොට විතරයි තව කෙනෙකුට උදව් කරන්න පුළුවන්. මැරුණට පස්සේ බෑ. යම්කිසි මනුස්සයෙක් ඉපදිලා නැත්නම් එයාටත් බෑ කෙනෙකුට උදව් කරන්න. හේතුව එයා ඉපදිලා නෑ, ඒකයි. යම්කිසි මනුස්සයෙක් ඉපදිලා ඉන්නවා එයා මැරිලා නෑ. ආන්න ඒ අතර තමයි තවත් කෙනෙකුට උපකාරයක් කරන්න පුළුවන්. ඒවගේ මේ සියුම්ව පවතින්නා වූ ධර්මයක් තවත් ධර්මයකට උදව්වක් උපකාරයක් කරන්න පුළුවන් කම තිබෙන්නේ ඒක පවතින වෙලාවේ පමණයි. ඒක නිසා කියනවා, යම්කිසි දෙයක් තිබීමම තවත් එකකට උදව්වක් උපකාරයක්ය කියලා. අන්න ඒකට කියනවා **'තිබෙන බව' 'විද්‍යාමාන බව'** තවත් එකකට උදව් වෙනවා කියලා.

අපි ගොරෝසු උදාහරණයක් ගත්තොත් ගහක අතු තිබෙනවා. ගහේ අතු තිබෙන්නේ කඳ තිබෙන නිසා. ගහක කොළ තිබෙනවා, කොළ තිබෙන්නේ අතු තිබෙන නිසා. අතු නැත්නම් කොළ හැදෙන්න බෑ. ඒවගේම තමයි ගහක මල් තිබෙනවා මල් හැදෙන්නේ රිකිලි, පුංචි දළු තිබෙන නිසා, අතු තිබෙන නිසා. තවත් එකක ඇති වීමට, වැඩීමට උදව් කරනවා නම් යමක් ඒකට කියනවා 'ඇති බැවින්' 'තිබෙන බැවින්' 'විද්‍යාමාන බැවින්' උදව්වක් උපකාරයක් වෙනවා කියලා.

දැන් මේක හිතේ තියා ගන්න. මේක ගාම්භීර ධර්මයක්. අත්ථි ප්‍රත්‍යය ගැන කථා කරනකොට තිබෙනවා රූප ගැන වෙනමම කථා කරන්න ඕනෑ. ඒවා ඔවුනොවුන්ට අත්ථි භාවයෙන් ප්‍රත්‍යය වෙන ස්වභාවය, මහා භූත ධර්ම පිළිබඳව, ඒවගේම නිද්දේස වාරයේත් හරි ගොඩක් දිගට තිබෙනවා. ඊට පස්සේ ආයතන ධර්ම වශයෙන් සහ ගෝචර ධර්ම වශයෙන් තිබෙනවා. ඒක අපි ඊළඟ අවස්ථාවේ කථා කරමු අත්ථි ප්‍රත්‍යය ඇති වෙන්නේ කොහොමද කියලා.

මේක ආරම්භයක් හැටියට අද මම ගත්තේ. මේකේ තවත් තිබෙනවා කොටස් ආකාර 07ක් අපි ඉස්සෙල්ලා කථා කරපු ප්‍රත්‍යය ධර්ම එක්කාසු කරලා ඒවත් ළංකරගෙන තමයි මේක කියන්න ඕනෑ කම තියෙන්නේ. ඒකෙ ගුණ මේකට ඇදලා ගන්න සිද්ධ වෙනවා. ඊළඟට රූප ධර්ම පිළිබඳව චිත්ත චෛතසික ධර්ම පිළිබඳවත් අපි ඉස්සරහදි කථා කරමු. මම හිතනවා මේ ආරම්භය ඉතා හොඳ ආරම්භයක්. ඒවාගේම අර මහත්මියක් කිව්වා මාර්ග ප්‍රත්‍යය පිළිබඳව කියන්න ඕනෑ කියලා, අපි ඒක වෙනමම අරගෙන තව ටිකක් වැඩියෙන් විස්තර ඇතුව කථා කරමු. අපි සැමදෙනාටම මේ වෙලාවේදී ධර්ම අවබෝධය නිර්වාණ අවබෝධය වේවා කියලා මෛත්‍රියෙන් ආශිර්වාද කරනවා.

<u>ජයන්ත මහත්මයා</u> - අප්‍රමාණ පිං ස්වාමීන්වහන්ස, ඔබවහන්සේ අපිට ගිය අවුරුද්ද පුරාම මේ පට්ඨාන දේශනා කියලා දුන්නා. ඒවගේම අපිට භාග්‍යක් ලැබුණා ස්වාමීන්වහන්සේගේ සිඩ්නි නගරයේ පැවැත්වූ සජීවී වැඩ සටහන් වලට සම්බන්ධ වෙන්නත්. ඒවගේම ඕස්ට්‍රේලියානු සංචාරයෙනුත් බොහෝ දෙනෙක් ප්‍රයෝජන ගත්තා. ඔබවහන්සේට අපි පුණ්‍යානුමෝදනා කරනවා. අපිත් භාග්‍යවන්තයි කියලා සලකනවා. දළුවත්ත මහත්මයාටත් අපි ගොඩක් පිං දෙනවා මේ ධර්ම මණ්ඩපය සකස් කරලා දීලා ස්වාමීන්වහන්සේලා හඳුන්වලා දීලා මේ කරන ලද සේවාවට. එහෙමනම් ස්වාමීන්වහන්ස ඔබ්වහසේගේ පාද නමස්කාරකරමින් පුණ්‍යානුමෝදනා කරනවා මේ තාක් කාලයක් අපිට දැක්වූ අනුග්‍රයටත්. මේ වසරයේදීත් ඔබවහන්සේගේ අනුග්‍රහය අපිට දිගටම ලැබෙයි කියන බලපොරොත්තුවෙනුත් අද දවසේ සාකච්ඡාව සම්බන්ධයෙනුත් නැවත වරක් පුණ්‍යානුමෝදනා කරමින් ඔබ වහන්සේට යොමුවෙනවා අද දේශනාව නිමාවට පත්කරන ලෙසට. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - හොඳයි, සැම දෙනාටම තෙරුවන් සරණයි! යහපතක් සැනසිල්ලක් වේවා! අද අපි 2018 අවුරුද්දට ධර්ම සාකච්ඡාව ආරම්භ කිරීමක් වශයෙන් මේ කාලය ගත්තේ. පින්වත් ජයන්ත මහත්මයා කියපු විදියටම අපේ පින්වත් සැම දෙනාටම ධර්ම අවබෝධය නිර්වාණ අවබෝධය වේවා

කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. විශේෂයෙන්ම අපේ ලලිත් දළුවත්ත මහත්මයාට ඒවගේම මහත්මාගේ පවුලේ සැම දෙනාටමත් නිරෝගී දීර්ඝායුෂ වේවා. එතුමා තමයි මේ වැඩේ මේ විදියට ආරම්භ කරලා ලෝකෙ වටේ ඉන්නා වූ සත්පුරුෂ  අය එකතු කරගෙන මේ වැඩ සටහන කරගෙන ආවේ. අපි ඒකෙ කොටස් කාරයෝ උනා පසු කාලීනව. ඉතින් ඒ  මහත්මයාටත්  නිදුක් නිරෝගී දීර්ඝායුෂ වේවා! ධර්ම අවබෝධ වේවා! අපේ පින්වත් ජයන්ත රත්නායක මහත්මයා කල්‍යාණ මිත්‍රතත්වයෙන් ඉදිරිපත් වෙලා සැම දෙනාම වෙනුවෙන් අපිටත් කථා කරලා මේ වැඩ සටහන පටන්ගමු කියලා මේ කාලය යොදා ගත්තා. ඉතින් අපේ ජයන්ත මහත්මයාගේ කල්‍යාණ මිත්‍රත්වය සහ අනිත් අය එකතු කරගෙන ධර්මය බෙදා දීමට තිබෙන උද්යෝගයමත්බව අපි බොහෝම මෛත්‍රීයෙන් අගේ කරනවා. ඒවාගේම අපේ අනිත් මහත්ම මහත්මීන් සියලු දෙනාටමත් සෙත් ප්‍රාර්ථනා කරනවා. කල්‍යාණ මිත්‍රයන්ගේ සිත් එක්කාසුවක තවත් අවස්ථාවක් තමයි මේ. ඒ නිසා මේ ධර්මය තවත් හොඳින් තේරුම් අරගෙන ඒවාගේම කෙලෙසුන් නසාගෙන පරම ශාන්ත වූ ගාම්භීර වූ නිර්වාණ ධාතුව අවබෝධ කරගෙන හැමදෙනාටම නිවනින් සැනසෙන්න ලැබේවා! ඒවාගේම සැමදෙනාටම නිවන් පිණිස මෙය මහා අනර්ග මාර්ගය වැඩීමක් වේවා! අපි හැමදෙනාටම සංසාර දුකෙන් මිදිලා නිවනින් සැනසී ඒ බුද්ධාදී උත්තමයන් වහන්සේලා අවබෝධ කරගත්ත නිවනට ගමන් කරලා නිවන අවබෝධ කරලා උන්වහන්සේලාට සමානව ඒ විඳින්නා වූ ධර්මය විඳින්න හැකිවේවා! සැම දෙනාගේම සිත් නිවනින්ම නිවියේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධූ!  සාධූ!  සාධූ!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබේන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.